# කඩොලාන පරිසරය ආශ්‍රිත සාම්ප්‍රදායික ජාකොටු ධීවර කර්මාන්තය.

**එම්.පී. මනෝජ් ප්‍රසන්න**
වැඩසටහන් සහකාර (පරිසර)
ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

ශ්‍රී ලංකාව තුළ ඉතාමත් තර්ජනයට පත්වූ පරිසරයක් මෙන්ම අධික ජෛව විවිධත්වයක් සහිත ඉතා සුවිශේෂී පරිසරයක් ලෙස කඩොලාන පරිසරය හැඳින්විය හැක. මෙම පරිසර පද්ධතිය විවිධාකාරයෙන් මානව ජීවිකාව කෙරේ බලපායි. කිවුල්දිය ධීවර කර්මාන්තය කෙරේ මෙම පරිසර පද්ධතිය ඍජු ලෙසම බලපෑමක් ඇතිකරනු ලබයි. මසුන්ට අවශ්‍ය ආහාර, ආරක්ෂාව මෙන්ම බිත්තර දැමීමට හා කුඩා සතුනට ආරක්ෂක වාසස්ථාන සැපයීම මෙම පරිසර පද්ධතිය ඉටුකරන ප්‍රධාන කාර්යයන් ලෙස දැක්විය හැක. ඉතා ඈත අතීතයේ සිට කඩොලාන පරිසර පද්ධතිය වෙරළබඩ ජනතාවගේ ජීවන බර සැහැල්ලු කිරීමේලා විශාල දායකත්වයක් ලබාදී ඇත. මේ බව මෙම පරිසරය තුළ දක්නට ලැබෙන විසිදැල්, තෙප්පම්, කට්ටුදැල්, මස්අතු වැනි සාම්ප්‍රධායික ධීවර ක්‍රම අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වේ.

ජාකොටු ලෙස හඳුන්වනු ලබන්නේද විශේෂ ආකාරයක මත්ස්‍ය උගුලකි. ශ්‍රී ලාංකේය පූර්ණ අනන්‍යතාවයක් නැති වුවද ශත වර්ෂ ගණනාවක් තිස්සේ භාවිතා කිරීම තුළින් අපේ සංස්කෘතික අංගයක් බවට පත්ව ඇත. දැනට ඇති ලිඛිත හා පුරාවෘත සාක්ෂිවලට අනුව ඉන්දියාවෙන් මෙරටට කුලී සේවායන් ලෙස පැමිණි ජාවක සෙබලුන්ගෙන් මෙම සම්ප්‍රදාය මෙරටට පැමිණ ඇත. මෙම ක්‍රමයේ සීමිත ව්‍යාප්තියක් ඇති අතර, මාදු ගඟ තුළ ප්‍රමුඛත්වයක් පෙන්වයි. මෙයට අමතරව බොල්ගොඩ ඔය, කොඩ්ඩියාර් බොක්ක, රැකව හා යාපනය කලපුවල මෙම ක්‍රමය භාවිතා කෙරෙන බවට තොරතුරු ඇතත් වර්තමානයේදී භාවිතයේ ඇත්තේ මාදු ගඟ හා බොල්ගොඩ ඔයේ පමණි. යාපනය කලපුවේ හා කල්පිටිය කලපුවේ මෙම ක්‍රමයට සමාන ක්‍රමයක් වර්තමානයේ දක්නට ඇති අතර එය මෙම ජාකොටුවලින් බිඳී ආ ක්‍රමයක් වන්නට පුලුවන. කෙසේ නමුත් මෙම ජාකොටු සාදන ක්‍රමය සුළු වශයෙන් වෙනස් වන බව දක්නට ඇත.



*මාදු ගඟ හරහා ඉදිකර ඇති ජාකොටුවක්*



*ජාකොටුව කෙළවර ඇති උගුල්*

මෙම ජාකොටු විශේෂයෙන්ම ඉස්සන් ඇල්ලීම සඳහා සකසන ලද උගුල් විශේෂයකි. අනෙක් මත්ස්‍ය උගුල් මෙන් නොව ජාකොටු සම්පූර්ණයෙන්ම ගඟ හරහා ඉදිකරන විශාල උගුලකි. මෙම ක්‍රමය ප්‍රධාන වශයෙන් ඉස්සන් ඇල්ලීමට භාවිතා කලද, මේ තුළට වෙනත් මසුන් ද අසුවේ. මසුන් ගාල්වූ විට යම් කාලයක් මත්ස්‍යන්ට වර්ධනය වීමට ඉඩ ලැබේ.



*යාපනය කලපුවේ ඉදිකර ඇති ඉස්සන් උගුලක්*



*අල්ලාගන්නා ඉස්සන්*

ජාකොටු සැකසීම පාරම්පරික උරුමයක් වන අතර මේ සඳහා ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් අවසර ගත යුතු අතර, එම බලපත්‍රය වසරින් වසර අලුත් කල යුතුය. මෙම ජාකොටු පිළිබඳව නීති රෙගුලාසි යටත්විජිත සමයේ සිට පැවතෙන අතර, 1889 ගම්සභා ආඥා පනත, 1920 පළාත් පාලන ආඥා පනත, 1887 පළාත් මණ්ඩල ආඥා පනත, හා 1892 සුළු නගර සනීපාරක්ෂක ආඥා පනත මගින් ජාකොටු පිළිබඳ විවිධ නීති රෙගුලාසි ඉදිරිපත් කර ඇත. (කුලතුංග 2008)

ජාකොටු සැකසීමේදී ගඟ හරහා ඉහිසිටුවා බට පැළැල්ලක් සවිකිරීමෙන් මෙහි මූලික ව්‍යුහය සකසා ගනී. මෙහිදී ඉනි වශයෙන් ශක්තිමත් ඍජු ලී අවශ්‍ය වන අතර බොහෝ විට මේ සඳහා මල් කඩොල් *Bruguiera gymnoriza, B.sexangala* හෝ මහකඩොල් විශේෂ වන *Rhizophora mucronata* හෝ *Rhizophora apiculata* භාවිතා කරයි.



බොල්ගොඩ ගඟ හරහා ඉදිකර ඇති ජාකොටුවක්

මෙලෙස ගඟ හරහා ඉනි සිටුවා එනම් පැළැල්ල සවි කිරීමේදී ගඟ දෙපසින් බෝට්ටු හා අනෙකුත් ධීවර යාත්‍රා ගමන් කිරීමට හැකිවන පරිදි සවිකල යුතු බව ජාකොටු පිළිබඳ සඳහන් වන නීති රෙගුලාසිවලට ඇතුළත් කර ඇත. නමුත් මාදු ගඟ ආශ්‍රිතව මෙම නීති උල්ලංඝනය කළ අවස්ථා ද සුලභ නොවේ.




*Bruguiera gymnoriza* ශාකයක්

පසුව මෙම ව්‍යුහය බටපැළලි ආධාරයෙන් පහත දක්වා ඇති පරිදි උගුල් සැකසීම කල යුතුය. මෙහි මහ කාමරය, පුංචි කාමරය හා හිර කොටුව ලෙස කොටස් තුනකි. මෙහිදී මහා උගුල ලෙස ක්‍රියාකරන්නේ අවසානයේ ඇති හිරකොටුවකි.

සෑම ජාකොටුවකම මෙවැනි උගුල් 3 - 4 ක් පමණ සවිකරයි. මේ සෑම කුටියකම රාත්‍රියේදී භූමිතෙල් පහනක් දැල්වීම සිදුකරයි. මෙමගින් නිකුත් වන ආලෝකය නිසා ඒ අසලින් යන ඉස්සන් එම පැළැල්ලෙන් දිස්වෙන ආලෝකය කරා ගමන් කිරීම සිදුවේ. මෙලෙස ආලෝකය ඔස්සේ ගමන්කර අවසානයේදී හිරකොටුව තුළ හිරවේ. මෙම උගුල සකසා ඇති ආකාරය නිසා හිරකොටුව තුළට ගමන් කල මසුන්ට නැවත පැමිණිය නොහැක.

අතෝලිය කොටුව, වැල්කොටුව හා කපොල්ල කොටුව ලෙස විවිධ නම්වලින් හඳුන්වන ජාකොටු වර්ග ඇති අතර අතෝලිය කොටුව මින් වඩාත් පලදායි කොටුව ලෙස හැඳින්වුවද වර්තමානයේ මෙම වර්ගයේ ජාකොටු දක්නට නොමැති බව සඳහන්වේ.



*Rhizophora mucronata*

මෙම ජාකොටු වසර 800ක් පමණ අඛණ්ඩව මෙරට තුළ ක්‍රියාත්මකවූ සාම්ප්‍රදායික ධීවර උගුල් ක්‍රමයකි. මෙම ක්‍රමය මුලින්ම පවුල් කිහිපයකට අයත්වූ අතර පසුව පාරම්පරිකව අයිතිකරුවන් සංඛ්‍යාව වැඩි වී ඇත. මෑත භාගයේදී මාදු ගඟ ආශ්‍රිතව පමණක් මෙවැනි ජාකොටු 50ක් පමණ දක්නට ඇත.

ඇතැම් විට මෙම ජාකොටු කර්මාන්තය විවිධ ගැටළු රාශියකට මුහුණදීම නිසා ඒවා පිරිහීමට ලක්ව ඇත. මෙහිදී ප්‍රධානතම ගැටළුව ලෙස හඳුනාගත හැක්කේ දැනට සමස්ත කඩොලාන පරිසරය මුහුණදී ඇති විවිධ පාරසරික අක්‍රමිකතා හේතුවෙන් ඉස්සන් බෝවීම අඩුවීම හා එතුලින් ලබන ආදායම අඩුවීමයි.

එමෙන්ම ජාකොටුවක් අලුතින් සැකසීමට හෝ පැරණි ජාකොටුවක් අලුත් කිරිම සඳහා අධික වියදමක් යන බැවින් ධීවරයන් මේ කෙරේ දක්වන උනන්දුව අඩු වී ඇත.

වර්තමානයේ මාදු ගඟ තුළ සාම්ප්‍රදායිකව පැවත ආ ජාකොටුකරුවන්ගේ ශීඝ්‍ර කඩා වැටීමක් දක්නට ඇත. මෙම කර්මාන්තයේ රැඳෙන්නන් ක්‍රමක්‍රමයෙන් වෙනත් රැකියා හෝ වෙනත් ධීවර ක්‍රම වෙත යොමුව ඇති බව දක්නට ඇත. තවදුරටත් මාදු ගඟේ ඇති පාරිසරික තර්ජන අවම කිරීමට නොහැකි වුවහොත් ඉස්සන්ගේ ගහණය අඩුවීම මෙන්ම වසර සිය ගණනක් පැරණි ජාකොටු කර්මාන්තය ද එම පරිසර පද්ධතියෙන් ඉවත් වී යාමට සිදුවිය හැකිය. සාම්ප්‍රදායික මෙන්ම තිරසර ක්‍රමයක් ලෙස සැලකියහැකි ජාකොටු කර්මාන්තය තවදුරටත් පවත්වා ගැනීමට මාදු ගඟේ හා බොල්ගොඩ ගඟේ කඩොලාන පරිසර පද්ධතිය සංරක්ෂණය කළයුතු බව ප්‍රදේශවාසීන්ගේ මෙන්ම පරිසර හිතකාමී ප්‍රජාවට අවබෝධ කරවීමට කාලය එළඹ ඇත.